# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,603 - 2009 මැයි මස 22 වැනි සිකුරාදා - 2009.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 654 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 656 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මැයි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මැයි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


651 - B 080015 —9,125 (2009/05)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදා හරිණු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයකු විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

සංචාරක බංගලා භාරකරු තනතුර

මෙම දෙපාර්තමේන්තුවේ තිස්සමහාරාම සංචාරක බංගලාව සඳහා බංගලා භාරකරුවකු තෝරා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර සකස් කර ගත් අයදුම්පත් 2009.06.15 දිනට පෙර සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අංක 28, ස්ටේපල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම්පස "සංචාරක බංගලා භාරකරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය.-* රු. 11,730-100x10-110x10-120x10-130x12- රු. 16590 (මාසික) රු. 12,030/- ක වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

04. *වයස් සීමාව.-* ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.)

05. *අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.-*

*(අ)* අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

*(ආ)* 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වීම හෝ ඊට ඉහළ විභාගයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

*(ඇ)* පෙරදිග හා අපරදිග කෑම පිසීමෙහි විශිෂ්ඨ දැනුමක් ලබා තිබිය යුතුය. තානායම්වල හෝ වෙනත් ස්ථානයන්හි ආහාර සැපයීම පිළිබඳව ලබා ඇති පළපුරුද්ද, මුළුතැන්ගෙවල් හා තානායම් වල සනීපාරක්ෂාව හා නියම අන්දමින් අමුත්තන් පිළි ගැනීම පිළිබඳව මනා දැනුමක් ඇති අයදුම්කරුවන් පිළිබඳව විශේෂයෙන් සලකා බලනු ඇත. අදාළ කටයුතු පිළිබඳව වසර 03 (තුනක) පළපුරුද්දක් තිබිය යුතුය.

*(ඈ)* ඉංග්‍රීසි/දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය අමතර සුදුසුකමක් වේ.

06. *බඳවා ගන්නා ක්‍රමය.-* ඉහත 04, 05 වැනි ඡේදවල සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වෘත්තීය හැකියාව පරීක්ෂා කෙරෙන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් අන්දමට ලකුණු ප්‍රදානය කෙරේ.

| | | ලකුණු |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් සඳහා | - | 40 |
| ඉංග්‍රීසි භාෂාව කථා කිරීමේ හැකියාව | - | 15 |
| දෙමළ භාෂාව කථා කිරීමේ හැකියාව | - | 15 |
| පුහුණුව හා පළපුරුද්ද | - | 30 |
| එකතුව | | 100 |

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඉහත සුදුසුකම් ඇති ස්ථිර සේවකයන්ට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය. එවැනි අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

08. *සේවා කොන්දේසි.-* මෙම පත්වීම තුන් (03) අවුරුදු පරිවාස කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත. (සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ I කොටස : (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කළ යුතුය.)

09. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛන වල මුල් පිටපත් (මුල් පිටපත් නොවේ) ස්වකීය අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

I. උප්පැන්න සහතිකය,

II. චරිතය පිළිබඳ මෑත දී ලබාගත් චරිත සහතික 02 ක්, ඉන් එකක් තමා ස්ථිරව පදිංචි ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරියාගෙන් ලබා ගත් චරිත සහතිකයක් විය යුතුය,

III. අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීම සඳහා වූ සහතික,

IV. විශේෂ සුදුසුකම් තහවුරු කෙරෙන පිළිගත හැකි සහතික. (සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් ආදිය ගෙවනු නොලැබේ.)

### *ආදර්ශ අයදුම්පත්‍රය*

සංචාරක බංගලා භාරකරු තනතුර

*ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව*

01. (අ) මුලකුරු සමග නම :——————;

(ආ) සම්පූර්ණ නම :——————;

02. ජාතික හැඳුනුම්පත් අංකය :——————;

03. වර්තමාන ලිපිනය :——————;
ස්ථිර (පදිංචි ලිපිනය) :——————;

04. ජන වර්ගය :——————;

05. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :——————;
(ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

06. උපන් දිනය :——————;

07. *ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස
අවුරුදු :————, මාස :————, දින :————,

08. අධ්‍යාපන සුදුසුකම් :——————; (සමත් වී ඇති විභාගයන් සඳහන් කරමින් සහතික පිටපත් අමුණන්න)

09. *ගැසට් නිවේදනයේ* 5(ඇ, ඈ) යටතේ ලබා ඇති වෙනත් සුදුසුකම් :——————;

10. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(I) :——————;
(II) :——————;

11. ඔබ මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක් දරා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :——————;

ඉහත සඳහන් කරුණු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේ ඉහත සඳහන් කරන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය ඒවා බව හෙළි වුවහොත් මා සේවයට පත්කරගෙන ඇතත්, එම පත්වීම කිසිම වන්දියක් නොමැතිව අවසන් කිරීමට යටත්වන බවත් මම දනිමි.

——————;
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

05-435

---

**පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ**

ප්‍රවෘත්ති නිළධාරි තනතුර

මෙම අමාත්‍යාංශයේ පුරප්පාඩු වී ඇති ඉහත දැක්වෙන තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. *වැටුප් බණ්ඩය හා වැටුප් පරිමාණය.*–රා. ප. ච. අංක 06/2006(iv) අනුව එම්එන්-4-2006-A හි ආරම්භක පියවර.

මාසික ඒකාබද්ධ වැටුප.–රු. 15,215-10x215-2x240-7x320-15x360-රු. 25,965/- මෙම තනතුරට පත්වී වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

II. *වයස් සීමාව.*–මෙම තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.

III. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) 1. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම

හෝ

2. රජය පිළිගත් ආයතනයක මාධ්‍ය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*සමග*

(ආ) පුවත්පත් ආයතනයක හෝ රජයේ හෝ සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රචාරක කාර්ය මණ්ඩලයක අදාල ක්ෂේත්‍රයේ සේවයේ නියුක්තව අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය).

IV. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*–මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවීමට ඔබ බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය.*–අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුව තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලකුණු පරිපාටිය පහත දැක්වේ.

01. මෙම කොටස සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය - ලකුණු 20

(I) ජන සන්නිවේදනය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම

(අ) පළමුපෙළ සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 20
(ආ) දෙවනපෙළ ඉහල සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 15
(ඇ) දෙවනපෙළ පහල සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 12
(ඈ) සාමාන්‍ය සමත්වීම (මූලික සුදුසුකම සඳහා පිළිගත් උපාධිය නොවන්නේ නම්) - ලකුණු 10

(II) ජන සන්නිවේදනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා උපාධියක් ලබා තිබීම

(අ) පළමුපෙළ සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 15
(ආ) දෙවනපෙළ ඉහල සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 12
(ඇ) දෙවනපෙළ පහල සාමාර්ථයක් සහිතව සමත්වීම - ලකුණු 10
(ඈ) සාමාන්‍ය සමත්වීම (මූලික සුදුසුකම සඳහා පිළිගත් උපාධිය නොවන්නේ නම්) - ලකුණු 08

(III) ඉහත I, II උපාධි හැර වෙනත් උපාධි සඳහා

(අ) මූලික සුදුසුකම් සඳහා පිළිගත් උපාධිය පළමු පෙළ සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම - ලකුණු 05
(ආ) මූලික සුදුසුකම් සඳහා පිළිගත් උපාධිය දෙවන පෙළ ඉහල සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම -ලකුණු 03
(ඇ) මූලික සුදුසුකම් සඳහා පිළිගත් උපාධිය දෙවන පෙළ පහල සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම - ලකුණු 01

02. මෙම කොටස සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය - ලකුණු 20

(I) මූලික අධ්‍යාපන සුදුසුකමට අමතරව ජන සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 20

(II) මූලික අධ්‍යාපන සුදුසුකමට අමතරව වෙනත් පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 10

(III) මූලික අධ්‍යාපන සුදුසුකමට අමතරව ජන සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම - ලකුණු 10

(IV) මූලික අධ්‍යාපන සුදුසුකමට අමතරව වෙනත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම - ලකුණු 05

(ඉහත දැක්වෙන පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන්හි අධ්‍යයන කාලය එක් වසරක් හෝ ඊට වැඩි විය යුතුය.)

03. පුවත්පත් ආයතනයක හෝ රජයේ හෝ සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රචාරක කාර්ය මණ්ඩලයක අදාල ක්ෂේත්‍රයේ සේවයේ නියුක්තව සිටිනම් සේවා කාලය වසර 03 කට වැඩි එක් සම්පූර්ණ වසරක් සඳහා ලකුණු 05 බැගින් ලකුණු උපරිමය - ලකුණු 30

04. විද්‍යුත් හෝ මුද්‍රිත ජනමාධ්‍ය තුළින් ප්‍රකාශයට පත්කර ඇති ස්වීය නිර්මාණ සඳහා එක් නිර්මාණයකට ලකුණු 1 බැගින් උපරිම - ලකුණු 20
(පිළිගත හැකි ලියකියවිලි මගින් සනාථ කළ යුතුය)

05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දෙන ලකුණු උපරිම - ලකුණු 10
(එහි සංයුතිය පහත පරිදි වේ.)

(I) මාධ්‍ය හමුවක් මෙහෙයවීමේ හැකියාව - ලකුණු 05

(II) මාධ්‍ය නිවේදන නිකුත් කිරීමේ හැකියාව - ලකුණු 05

*සැලකිය යුතුයි.-* දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයන් විසින් සම්පූර්ණ නම, ලිපිනය, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරමින් තමන් විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2009.06.19 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 330, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීමට කටයුතු කරන මෙන් දන්වනු ලැබේ.

(ලියුම් කවරයේ වම් කෙළවරේ තනතුර සඳහන් කරන්න.)

එච්. පී. කැෂියන් හේරත්,
ලේකම්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

05-508

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවන්හි පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2009

සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවේ වෘත්තීය චිකිත්සක පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2001 වර්ෂයේ සිට 2006 දක්වා අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ලබා ගන්නා ලද Z අගය අනුව ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

02. පුහුණු පාඨමාලාවට බඳවාගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනම් කර ගනිමින් සිසුන් පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

03. මෙම පාඨමාලා පූර්ණකාලීන පාඨමාලාවක් බැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලා සඳහා අයදුම් නොකළ යුතුය.

04. අදාල පාඨමාලාව සහ පුහුණු කාලය පහත දක්වා ඇත.

| සංකේත අංකය | පාඨමාලාව | පුහුණු කාලය |
|---|---|---|
| 01 | වෘත්තීය චිකිත්සක | අවුරුදු 02 යි. |

05. අධ්‍යාපන සුදුසුකම් :- 2001 සිට 2006 දක්වා අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට විද්‍යා විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත්වී තිබීම හා මෙම පාඨමාලාව වෙනුවෙන් අපේක්ෂිත විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්ය වේ. පාඨමාලාව සඳහා අවශ්‍ය වන සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (සා.පෙළ,) සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | වෘත්තීය චිකිත්සක | අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයන් දෙකක් එකවර සමත්වීම. | සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) සමත්වීම. |

06. *අනෙකුත් සුදුසුකම් :-*

(අ) 2009.06.30 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය:-*

(අ) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පතක් සකස් කර ගත යුතුවේ. අයදුම්පතේ "මුද්දර" යන ස්ථානයේ රුපියල් 500ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/ රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුරු නාමය සඳහන් කොට 2009.06.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. රජයේ හෝ අර්ධ රජයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

09. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

11. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉහත අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ ා

*(අ)* උප්පැන්න සහතිකය ;

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික හෝ සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විදුහලේ විදුහල්පතිවරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල සනාථ කරන මුල් ලිපිය යනාදී ලිපිලේඛන ;

*(ඇ)* විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල සනාථ කරන Z ලකුණු මට්ටම සඳහන් සහතිකය ;

*(ඈ)* ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය ;

*(ඉ)* දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ පදිංචිය සනාථ කරන ලිපිය.

13. *පුහුණු කිරීමේ පටිපාටිය* :-

I. තෝරාගත් අයදුම්කරුවන් ඉහත 04 ඡේදයේ අදාළ පාඨමාලාව සඳහා අදාළ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

II. පුහුණුව සඳහා ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ තමන් ඇතුළත් කරගනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

IV පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට මාසිකව රුපියල් 6,000ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

V. පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත් එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව, පත්වීම් ලැබුණහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත III ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැය වූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගනු ඇත.

14. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්.*— පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් දිවයිනේ ඕනෑම පළාතක ඇතිවන පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කරගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ඇතිවූ විට අදාළ තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත්කිරීම සලකා බලනු ලැබේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

16. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

17. ඉහත පරිදි බඳවාගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

18. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2009 මැයි මස 04 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය*

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවේ වෘත්තීය චිකිත්සක පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම - 2009**

*අයදුම්කරන තනතුර* : ..........................................................................

01. *(අ)* මුලකුරු සමග අගට යෙදෙන නම :——————;
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

*(ආ)* සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————;

*(ඇ)* සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :——————.

02. ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

03. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

.......................................... ......................................
.......................................... ......................................
.......................................... ......................................
.......................................... ......................................

04. *(අ)* ස්ථිර ලිපිනය සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

.......................................... ......................................
.......................................... ......................................
.......................................... ......................................
.......................................... ......................................

*(ආ)* දිස්ත්‍රික්කය:——————;
*(ඇ)* ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද ? ඔව්/නැත :——————;
*(ඉ)* ඔව් නම් කොපමණ කලක පටන් ද? :——————.

05. උපන් දිනය : වර්ෂය :————; මාසය :————; දිනය : ————
2009.06.30 දිනට වයස : අවුරුදු:————; මාස:————; දින:————;

06. *(අ)* ස්ත්‍රී/පුරුෂ භාවය [ ] (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී - F
පුරුෂ - M

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. විවාහක/අවිවාහක බව :——————.

09. අධ්‍යාපන සුදුසුකම් :
*(අ)* අ.පො.ස. (උ.පෙළ) විභාගය (විද්‍යා විෂයයන් පමණි) (ලකුණු සටහන් පිටපත් අමුණන්න) ඃ

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :——————;
විභාගයේ වර්ෂය :——————;
විභාග අංකය :——————;
Z අගය :——————;

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

*(ආ)* අ.පො.ස. (සා.පෙළ) විභාගය – පළමු වර
විභාගයේ වර්ෂය :——————;
විභාග අංකය :——————;

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ.පො.ස. (සා.පෙළ) විභාගය – දෙවන වර
විභාගයේ වර්ෂය :——————;
විභාග අංකය :——————;

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද ?

ඔව් [ ] නැත [ ]

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :——————.

11. *අයදුම්කරුගේ සහතිකය* ඃ

*(අ)* මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවටත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

*(ආ)* ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු

එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

මුද්දර කොටුව

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී 2009........................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :——————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

05-367